**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ද 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 2,688,371 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ගිණුම් තැබීමේදී සිදුවූ අඩුපාඩුවක් බව පිළිගනිමි. ඉදිරියේදී එම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.431,666 ක් වූ සතිපොළ ගොඩනැගිලි 06 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ගිණුම් සැකසීමේදී සිදුවූ වරදක් බව පිළිගනිමි. 2019 වසරේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා අදාළ උපලේඛන අතර රු.2,110,701 ක වෙනසක් පැවතුණි. | අදාල නිවැරදි කිරීම් කළ යුතු වේ. | ගිණුම් සැකසීමේදී සිදුවූ වරදක් බව පිළිගනිමි. 2019 වසරේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.41,291,064 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,467,415 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.220,059 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කල ආදායම් | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කල ආදායම | රැස් කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 11,021 | 11,021 | 5,795 | 9,695 | 11,096 | 11,096 | 11,265 | 7,437 |
| කුලී | 8,819 | 8,819 | 9,907 | 4,201 | 9,090 | 9,090 | 8,875 | 3,512 |
| බලපත්‍ර ගාස්තු | 651 | 396 | 867 | - | 2,626 | 375 | 481 | - |
| වෙනත් ආදායම් | 18,630 | 18,630 | 45,487 | 41,261 | 18,482 | 18,482 | 6,147 | 3,208 |
| | **39,121** | **38,866** | **62,056** | **55,157** | **41,294** | **39,043** | **26,768** | **14,157** |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසු ගිය වර්ෂයේ රු. 7,436,958 ක් වූ වරිපනම් හිඟයෙන් අය කර ගෙන තිබුණේ රු. 1,749,780 ක් පමණි. එම | හිඟ ආදායම් කඩිනමින් රැස් කළ යුතු වේ. | 2013 වර්ෂයේදී ලබාදුන් නඩු තීන්දුවක් හේතුවෙන් ප්‍රා.ස.රීති |

| | | |
|---|---|---|
| අය කර ගත් මුදලින් දේපල තහනම් කිරීමේ නියෝග මගින් අය කරගැනීම් රු. 617,665 ක් වූ අතර එය පසු ගිය වර්ෂයන්ට අදාල මුළු හිගයෙන් සියයට 8 ක් විය. | | ප්‍රකාරව ක්ෂේත්‍රයේ ගොස් වරිපනම් එකතු කිරීම සිදු නොකළ අතර එමනිසා වරිපනම් එකතු කිරීම පසුබෑමකට ලක් විය. |

**2.2.3 උසාවි දඩ හා බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.837,993 හා මුද්දර ගාස්තු රු.40,453,071 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුද්දර ගාස්තු ලේඛන නිසි පරිදි සකස් කිරිමට පියවර ගතිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ තෘතීක මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 12ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 13ක් පැවතුණි. | නියමිත පුරප්පාඩු සපුරාලීමට කටයුතු කළ යුතු වේ. | අනුමත පුරප්පාඩු පිළිබඳ තොරතුරු ප්‍රධාන ලේකම් වෙත යවා ඇත. |

### 3.2 වත්කම් කළමණාකරණය

**3.2.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භුක්ති විදින ඉඩම් 09 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරාගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ඉඩම් ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |

### 3.2.2 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොල්ගහවෙල කොළඹ පාරට මුහුණලා සභාව සතුව පැවති නිල නිවාසය හා ගරාජය වසර 11 කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | පාවිච්චියට ගත හැකි පරිදි සකස් කළ යුතු වේ. | මෙය පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේදී අලුත්වැඩියා කිරිමට කටයුතු කරමි. |